C 377 BAN

# ශ්‍රී ලංකාවේ අ.පො.ස. (සා.පෙළ) සිසුන්ගේ වෘත්තීය අභිලාෂ සපුරාලීම සඳහා විෂයමාලාව සැලසුම්කරණය කළ යුතු ආකාරය

## (මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් කිහිපයක නියැදියක් ඇසුරින් කරන අධ්‍යයනයක්)

# PLANNING CURRICULUM FOR ACHIEVING PROFESSIONAL ASPIRATIONS OF G.C.E.(O/L) STUDENTS IN SRI LANKA

## (A STUDY BASED ON A SAMPLE OF FEW SELECTED SCHOOLS IN KANDY DISTRICT)

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන විද්‍යා අංශයේ
අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන
පර්යේෂණාත්මක නිබන්ධනය

1998

**එම්.පී.බණ්ඩාර**
**සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය,**
**පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (Khan Gold Medal)**

පර්යේෂණ උපදේශක
පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන විද්‍යා අංශයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී, ආචාර්ය සිල්වි සේනාධීර මහත්මිය

523123

UNIVERSITY OF PERADENIYA
28-12-1999
LIBRARY

## ABSTRACT

This research has been designed to investigate the ways of planning secondary education curricula for the purpose of achieving vocational aspirations of the G.C.E. Ordinary Level students in Sri Lanka.

The research is based on a sample of 360 students and 180 teachers from year 10 and 11 classes in nine selected schools in the Kandy District. The data gathered through questionnaires given to the students and the teachers were examined by interviews arranged with the school principals and educationists.

The analysis of the data revealed that the present curriculum is not capable of achieving the professional aspirations of the students. Therefore this research stresses the need to plan the secondary education curricula on the following lines.

* Developing competencies of the students to suit their professional desires within the school itself.

* Including subjects in the curriculum relevant to the present needs of the society.

* Expanding opportunities for learning special and optional subjects according to the needs and the capabilities of the students.

* To provide a range of subjects for enhancing the professional, technical and practical skills of students to suit their vocational aspirations.

It is hoped that the aspirations of students could be fulfilled to some extent by implementing the proposals outlined in this study.

PERMANENT REFERENCE
FOR USE IN THE LIBRARY ONLY

## පර්යේෂණ සාරාංශය

අ.පො.ස. (සා.පෙළ) සිසුන්ගේ වෘත්තියමය අභිලාෂ සපුරාලන පරිද්දෙන්, විෂයමාලාව සැලසුම් කළ යුතු ආකාරය පිළිබඳව කරන ලද මෙම පර්යේෂණ අධ්‍යයනය පරිච්ඡේද හතකින් සමන්විතය.

පර්යේෂණයේ මූලික උපකරණ සඳහා ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා භාවිතා කිරීමට සිදුවිය. ප්‍රශ්නාවලින්ගෙන් ලබා ගත් දත්ත, වගු හා ප්‍රතිශත මගින් විශ්ලේෂණය කරන ලදි. සිසුන් හා ගුරුවරුන්ගෙන් ලබා ගත් දත්ත වැඩි දුරටත් විමර්ශනය කිරීම සඳහා විදුහල්පතිවරුන්, අධ්‍යාපනඥයින් හා විෂය විශේෂඥයන් සමඟ සාකච්ඡා පවත්වන ලද අතර තම ප්‍රතිචාර ගුණාත්මකව විශ්ලේෂණය කෙරිණි.

ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව දත්ත විශ්ලේෂණය කිරීමේදී, වර්තමාන විෂයමාලාවේ ස්වභාවය පිළිබඳ ලැබුණු ප්‍රතිචාර අනුව අනාවරණය වූයේ, වර්තමාන කාලීන රැකියා අවශ්‍යතා සපුරාලීමට විෂයමාලාවේ පවත්නා විෂයයන් ප්‍රමාණවත් නොවන බවයි. ශිෂ්‍ය වෘත්තියමය අභිලාෂ ඉටු කිරීමේ අදහසින් එක් එක් අවස්ථාවන්හි විෂයමාලාවට විවිධ තාක්ෂණික විෂයයන් එක් කළ ද, සෑම පාසලකම එක හා සමානව එම විෂයයන් හැදෑරීමට ඉඩ ප්‍රස්තා නොලැබී ඇති බව ද, ඒ ඒ විෂයයන් සම්බන්ධ පුහුණු ගුරුවරුන්ගේ හිඟය හා භෞතික සම්පත් නොමැති කම නිසා, සමහර ගම්බද පාසල්වල ක්‍රියාත්මක වූයේ, තාක්ෂණික විෂයයන් දෙකක් පමණක් බව ද හෙළිවිණි.

චිත්‍ර, නැටුම්, සංගීතය යන සෞන්දර්ය විෂයයන් සම්බන්ධව ද හෙළි වූයේ, සිසුනට සිය ලැදියා හා හැකියා අනුව සෞන්දර්ය විෂයයන් තෝරා ගැනීමට ඉඩ නොලැබෙන නමුත් ශිෂ්‍යයින් එම විෂයයන් හැදෑරීමට වඩා කැමැත්තක් දැක්වූ බවය.

ගණිතය, විද්‍යාව, හා ඉංග්‍රිසි භාෂාව යන විෂයයන් විෂයමාලාවේ අනිවාර්ය විෂයයන් කිරීම පමණක් ශිෂ්‍ය වෘත්තිය අභිලාෂ ඉටුකිරීමෙහි ලා ප්‍රමාණවත් නොවන බව ද, ක්‍රීඩා, සමිති සමාගම් හා ශිෂ්‍යභට, බාලදක්ෂ වැනි විෂය සමගාමී කටයුතු සඳහා විෂයමාලාවේ ලැබී ඇති ස්ථානය ප්‍රමාණවත් නොවන බව ද අනාවරණය විය.

ද්විතීයික පාසල් විෂයමාලාවේ පවත්නා ශාස්ත්‍රීය නැඹුරුව නිසා ද, ශිෂ්‍ය හැකියාවන්ට හා ලැදියාවන්ට අනුකූල විෂයයන් විෂයමාලාවට ඇතුළත් වී නොතිබීම ද, ශිෂ්‍යයෙකුගේ අනාගත ජීවනෝපාය සඳහා අවශ්‍ය ප්‍රයෝගික හා වෘත්තියමය පුහුණුවක් වර්තමාන ශාස්ත්‍රීය විෂයමාලාව තුළින් හා ඉගැන්වීම් ක්‍රම තුළින් නොලැබීමෙන් ද යනාදි කරුණු අනුව විෂයමාලාව නව සැලසුමකට ලක් කිරීමේ යෝග්‍යතාව හෙළිවිය.

මෙම පර්යේෂණයෙන් හෙළි වූ නිගමන සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ දී හොඳින් සැලසුම් කර ගත් වෘත්තීය මාර්ගෝපදේශ සේවාවක අවශ්‍යතාව අවධාරණය කර ඇත.

වත්මන් සාමාජීය අවශ්‍යතා ඉටු කරන විෂයයන් අ.පො.ස. (සා.පෙළ) විෂයමාලාවට ඇතුළත් කිරීමෙන්, සිසුනට වෘත්තීය අභිලාෂ ඉටු කර ගැනීමට පහසුවක් වන බැවින්, ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය, පරිගණක විද්‍යාව, භෝජනාගාර සේවය, රූපලාවන්‍ය, විසිතුරු මල් වගාව, ගෘහ කර්මාන්ත, ඇඳුම් මෝස්තර නිර්මාණ ආදී කෘෂිකාර්මික, කාර්මික, තාක්ෂණික හා කලාත්මක විෂයයන් රැකියා වෙළඳපොළ හා සංබන්ධ කළ යුතු ආකාරය පිළිබඳ යෝජනා ඉදිරිපත් කරන ලදී.

අවසාන වශයෙන් ශිෂ්‍ය වෘත්තියමය අභිලාෂ වලට අනුකූලව විෂයමාලාව සැලසුම් කළ යුතු ආකාරය පිළිබඳව ගත යුතු ක්‍රියා මාර්ග සම්බන්ධව යෝජනා ඉදිරිපත් කෙරිණි.

ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව යනාදී අනිවාර්ය විෂයයන් අර්ථාන්විතව ඉගැන්වීමේදී ශිෂ්‍ය හැකියා වලට අදාළව මට්ටම් කිහිපයකින් ඉගැන්වීම කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර, කුමන හෝ රැකියාවක් කිරීමේදී අවශ්‍ය වන පෞරුෂය, නායකත්වය, තර්කානුකූල චින්තනය, ගැටළු නිරාකරණය හා සන්නිවේදන කුශලතා වැනි ගුණාංග වර්ධනය කිරීම් වස් ක්‍රීඩා, සමිති සමාගම්, ශිෂ්‍ය භට, බාල දක්ෂ වැනි විෂය සමගාමී කටයුතු කෙරෙහි විෂයමාලාවෙන් වැඩි අවධානයක් යොමු කළ යුතු බවට ද අවධානය යොමු විනි.

ද්විතියික අධ්‍යාපනයේ නවය වසර දක්වා සියළුම පොදු විෂයයන් උගන්වා නවය වසරේ දී ශාස්ත්‍රීය, වෘත්තියමය, විද්‍යාත්මක, ගණිතමය, සෞන්දර්ය, ක්‍රීඩාමය වශයෙන් ශිෂ්‍ය හැකියා අනුව, වැඩි අවධානයක් ඒ ඒ අංශ වලට යොමු වන ආකාරයට විෂයමාලාව සැලසුම් කිරීම පිළිබඳව ද අදහස් ඉදිරිපත් කෙරිණි.

ශිෂ්‍ය අවශ්‍යතා, හැකියා අනුව විශේෂ සහ වෛකල්පික විෂයයන් හැදෑරීමේ අවස්ථා පුළුල් කිරීම ද, ශිෂ්‍යයාගේ විවිධ බුද්ධි මට්ටම් අනුව රැකියා අවශ්‍යතා සඳහා යෝග්‍ය වන ප්‍රායෝගික විෂයයන් කෙටිකාලීනව හැදෑරීමේ අවස්ථා බහුල කිරීම ද, ශිෂ්‍ය වෘත්තීය අභිලාෂ සාධනය සඳහා විෂයමාලාව සැලසුම් කිරීමේ දී වඩා වැදගත් වන බව පෙන්වා දී ඇත.

විෂයයන් ප්‍රායෝගිකව ඉගෙන ගැනීමේදී වෘත්තීය නිපුණතා වඩාත් වර්ධනය වන පරිදි සිසුන් කර්මාන්ත ශාලා, ගොවිපළවල් වැනි රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනය වල ප්‍රායෝගික පුහුණුවීම් වල යෙදවීම පිළිබඳව ද අවධානය යොමු කෙරිණි.

මේ යෝජනා ක්‍රියාත්මක කිරීමෙන්, ශිෂ්‍ය වෘත්තියමය අභිලාෂ ඉටු වන ආකාරයට, පවත්නා ද්විතියික පාසල් විෂයමාලාවේ නව සැලැසුමක් ඇති කළ හැකි බව පර්යේෂිකාවගේ විශ්වාසය විය.